ද මැසිනොද් විදුහල කඳාන De Mazenod College Kandana ද මැසිනොද් විදුහල කඳාන De Mazenod College Kandana ද මැසිනොද් විදුහල කඳාන De Mazenod College Kandana ද මැසිනොද්

# ද මැසිනොද් විදුහල, කඳාන

# De Mazenod College. Kandana

## ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා

2025.05.09

| පළමු වාර පරීක්ෂණය-2025 | 7 ශ්‍රේණිය | කාලය පැය 2 |
|---|---|---|

Learning Resource Center
R
De Mazenod College
Kandana

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**

(01) පසෙහි සාරවත් බව අඩුවීම සඳහා බලපාන සාධකයකි.

1. නිසි පරිදි ජලය ගලා යාමට සැලැස්වීම.
2. කොම්පෝස්ට් පොහොර යෙදීම.
3. පසට පොලිතීන් කෘෂි රසායන ද්‍රව්‍ය බැහැර කිරීම.
4. සුදුසු පරිදි විවිධත්වයෙන් යුතු බෝග වගාකිරීම.

(02) ගෙවත්තේ රැස් වන දිරාපත් වන අපද්‍රව්‍ය කළමනාකරණයට සුදුසුම ක්‍රමය කුමක්ද?

1. කොම්පෝස්ට් පොහොර සැකසීමට යොදා ගැනීම.
2. 2T සංකල්පය භාවිත කිරීම.
3. පුළුස්සා දැමීම.
4. පොලිතීන් උරවල දමා පසෙහි වැළලීම.

(03) 3R සංකල්පයේ භාවිත වන පියවරක් නොවන්නේ කුමක්ද?

1. පිරිපහදු කිරීම.
2. ප්‍රතිචක්‍රීකරණය කිරීම.
3. නැවත භාවිතයට ගැනීම.
4. භාවිතය අවම කිරීම.

(04) අඩු කැබලි සිටුවීමෙන් නව පැළ ලබාගත හැකි බෝගයකි.

1. මිරිස්
2. තක්කාලි
3. කංකුං
4. බණ්ඩක්කා

(05) ක්ෂේත්‍රයේ සිටුවීමට පෙර තවාන් දැමීම වඩා යෝග්‍ය වන බෝග වර්ගය වන්නේ,

1. මඤ්ඤොක්කා
2. මිරිස්
3. කහ
4. ඉඟුරු

(06) භූගත කඳන් සහිත බෝගයකි.

1. ඉඟුරු
2. තක්කාලි
3. මිරිස්
4. මුකුණුවැන්න.

(07) ආහාර අමුද්‍රව්‍ය කොටස් කළ පසු ඒවායේ වර්ණය වෙනස් වීම වැළැක්වීමට භාවිතා වන ප්‍රතිකර්මයක් නොවන්නේ කුමක්ද?

1. දෙහි යුෂ වල තැවරීම.
2. ජලයේ ගිල්වීම.
3. වාතයට විවෘතව තැබීම.
4. පොල් කිරිවල ගිල්වීම.

(08) ආහාර පිසීමේදී වඩාත් සැලකිලිමත් විය යුතු කරුණ කුමක්ද?

1. මිලෙන් අඩු අමුද්‍රව්‍ය සෑම විටම තෝරා ගැනීම.
2. විශාල ඉඩ ප්‍රමාණයක් සහිත මුළුතැන්ගෙයක් තිබීම.
3. මුළුතැන්ගෙයට හොඳින් ආලෝකය හා වාතාශ්‍රය ලැබීම.
4. ඉහත එකක්වත් අවශ්‍ය නොවෙයි.

(09) කොටස් කිරීමෙන් පසු පෙර ප්‍රතිකර්මවලට ලක් කිරීම අත්‍යාවශ්‍ය වන ආහාර අමුද්‍රව්‍යයකි.

1. පිපිඤ්ඤා
2. අලුකෙසෙල්
3. ගස්ලබු
4. තක්කාලි

(10) මෝටර් රථවල සංඥා ලාම්පු පාලනය කිරීමට යොදා ගැනේ,

1. දෙමං ස්විචය
2. ද්විධ්‍රැව දෙමං ස්විචය
3. එබුම් බොත්තම් ස්විචය
4. ඉහත එකක්වත් නිවැරදි නොවෙයි

## II කොටස

- ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(01)

I. නිවසේ ගෙවත්ත අලංකාරව පවත්වාගෙන යාමෙන් සැලසෙන වාසි හතරක් ලියන්න. (ලකුණු 4)

II. ගෙවත්තක පස සෝදා සෝදා පාළු වීම වැළැක්වීමට යොදාගත හැකි ජීව බාධක හා අජීව බාධක තුනක් බැගින් ලියන්න. (ලකුණු 6)

(02)

I. ඔබ නිවසේදී ආහාර පිසීමට විවිධ උපකරණ භාවිතා කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු හතරක් ලියන්න. (ලකුණු 4)

II. ආහාර පිසීමට භාවිතා වන විවිධ උපකරණ තුනක් ලියා ඒවා මගින් කරන කාර්යය ලියන්න. (ලකුණු 6)

(03)

I. ආහාරයක් පිසීම සඳහා ඔබ අමුද්‍රව්‍ය තෝරාගැනීමේදී අවධානය යොමු කළ යුතු කරුණු පහක් ලියන්න. (ලකුණු 5)

II. දිවා ආහාරයෙන් පසුගත හැකි අමතර ආහාරයක් පිළියෙල කරගන්නා ආකාරය පියවර වශයෙන් දක්වන්න. (ලකුණු 5)

(04)

I. ආහාරයක් සැකසීමට පෙර ආහාර සකසන පුද්ගලයා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග පහක් ලියන්න. (ලකුණු 5)

II. මුළුතැන්ගෙය සෞඛ්‍ය ආරක්ෂිතව හා ක්‍රමවත්ව පවත්වා ගැනීමට එහි තිබිය යුතු ලක්ෂණ පහක් ලියන්න. (ලකුණු 5)

(05)

I. නිවෙස් ආශ්‍රිතව ඉවතලන දිරාපත් වන අපද්‍රව්‍ය හා දිරාපත් නොවන අපද්‍රව්‍ය දෙක බැගින් ලියන්න. (ලකුණු 4)

II. ගෙවත්තක කොම්පෝස්ට් කොටුවක් සාදාගන්නා ආකාරය හා එයට යෙදිය යුතු අපද්‍රව්‍ය මොනවාදැයි කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 6)

(06)

I. පහත සඳහන් විද්‍යුත් උපාංගවල සංකේත ඇඳ දක්වන්න.

a. වියලි කෝෂය
b. විදුලිබල්බය
c. ධාරිත්‍රක
d. ආලෝක විමෝචක ඩයෝඩය (LED)
e. ස්විචය

(ලකුණු 5)

II. ඔබට වියළි කෝෂයක් වයර් කැබලි හා බල්බයක් ලබාදී ඇත්නම් ඒවා යොදා ගනිමින් සැදිය හැකි සරල පරිපථයක් සංකේත යොදා ගනිමින් අඳින්න.

(ලකුණු 3)

III. මෙහිදී වයර් කැබලි ඔස්සේ ගමන් කරන විද්‍යුත් ශක්තිය විදුලි බුබුල තුළදී පරිවර්තනය වන ශක්තිය ආකාර දෙක මොනවාද?

(ලකුණු 2)

(07) පහත සඳහන් වගන්ති නිවැරදි නම් "✓" ලකුණද වැරදි නම් "×" ලකුණද යොදන්න.

1) ගෙවත්තක සාර්ථකත්වය පවත්වාගෙන යාමට එහි පසෙහි සාරවත් බව වැදගත්ය. ( )

2) අපද්‍රව්‍ය නිසි ලෙස කළමනාකරණය කරගතහොත් ඒවා සම්පත් බවට හැරවිය හැකිය. ( )

3) 2T ක්‍රමය මගින් දිරාපත් වන කසල කළමනාකරණය කළ හැකිය. ( )

4) තවාන් බඳුනක බීජ විසුරුවීමෙන් අනතුරුව බීජ පැලවෙන තෙක් බඳුන පිදුරු තට්ටුවකින් වසා තැබීම සුදුසුය. ( )

5) ආහාර පිසීමට පෙර සූදානම් වීම තුළින් ඵලදායිතාවයෙන් යුතුව කටයුතු කළ හැකිවේ. ( )

6) කොලැන්ඩරය යනු මුළුතැන්ගෙයෙහි භාවිතා වන පෙරහන් වර්ගයකි. ( )

7) ආහාර හොඳින් පිසගැනීම නිසා ආහාර ජීර්ණය පහසුවේ. ( )

8) දිරාපත් නොවන අපද්‍රව්‍ය ගෙවත්තේ වළලා දැමීම සුදුසුය. ( )

9) වර්තමානය වන විට වගා පත්‍රිකාවක් සැකසීම සඳහා සුදුසුම ක්‍රමයක් ලෙස වදන් සැකසුම් මෘදුකාංග භාවිතා වේ. ( )

10) එබුම් බොත්තම් ස්විචය මගින් මෝටරයක චලිත දිශාව වෙනස් කළ හැක. ( )

(ලකුණු 10)